ලංකා විශ්වවිද්‍යාලයේ

# ලංකා ඉතිහාසය


ප්‍රධාන සංස්කාරක

( 1956 සිට 1958 මැයි දක්වා )

මහාචාර්ය හේම් චන්ද්‍ර රාය මහතා, පීඑච්. ඩී., ඩී. ලිට්.


## 1 කාණ්ඩය

පුරාණතම අවධිවල සිට 1505 දක්වා

## 1 භාගය

අනුරාධපුර යුගයේ අවසානය දක්වා


1 කාණ්ඩයේ සංස්කාරක මණ්ඩලය

උපකුලපති සර් නිකලස් ඇටිගල මහතා,

එෆ්. ආර්. සී. එස්., එෆ් ආර්. සී. ඕ. ජී., සම්මාන ඩී. එස්සී.,
විද්‍යාචක්‍රවර්ති (විද්‍යාලංකාර)

(සභාපති)

ඩබ්ලිව්. ජේ. එෆ්. ලැබ්රූයි මහතා, බී. ඒ.

එස්. නාදේසන් මහතා, බී. ඒ.

සී. ඩබ්ලිව්. නිකලස් මහතා, සම්මාන ඩී. ලිට්.

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා,

සී. බී. ඊ., පීඑච්. ඩී., සම්මාන ඩී. ලිට්.,
සාහිත්‍යචක්‍රවර්ති (විද්‍යාලංකාර)

(සංස්කාරක)



විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ
පර්යේෂණාංශයේ
සිංහල පරිවර්තනය

1964

# පෙරවදන

ලොව අන් කිසිදු රටකට නොදෙවෙනි මානව ශිෂ්ටාචාරයකට හා සංස්කෘතික උරුමයකට ශ්‍රී ලංකාව හිමිකම් කියයි. ශ්‍රී ලංකාව විදේශාධිපත්‍යයෙන් නිදහස අත්පත් කර ගැනීමෙන් අනතුරුව 1950 දශකයේ ඇති වූ සංස්කෘතික පුනරුදයේ ම ආනුෂංගික අංගයක් ලෙස මෙකී ඓතිහාසික උරුමය හා සම්ප්‍රදාය ශාස්ත්‍රීය පදනමකින් හා ගැඹුරු ලෙස අධ්‍යයනය කොට ලේඛනගත කිරීමට කටයුතු කරනු ලැබී ය. මෙකී සත් කාර්යය පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ පුරෝගාමිත්වයෙන් හා සුප්‍රකට පුරාවිද්‍යාඥයකු හා ඉතිහාසඥයකු වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ සංස්කාරකත්වයෙන් සිදු කෙරිණ. University of Ceylon : History of Ceylon නමින් පළ වූ මෙම ග්‍රන්ථයේ පළමුවන කාණ්ඩය කොටස් දෙකකින් සමන්විත වූ අතර, එම කොටස් දෙක පිළිවෙළින් 1959 හා 1960 යන වර්ෂවලදී ප්‍රකාශයට පත් කරන ලදි. මෙම ග්‍රන්ථය ආදිතම යුගයේ සිට 16 වන සියවසේ ආරම්භය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ව එතෙක් පළ වූ විශිෂ්ටතම ශාස්ත්‍රීය හා ප්‍රාමාණික අධ්‍යයනය විය.

එම කෘතියේ ශාස්ත්‍රීය වටිනාකම මෙන් ම සාමාජීය හා සංස්කෘතික වශයෙන් එහි ඇති කාලීන වැදගත්කම සලකා ඉංග්‍රීසියෙන් පළකොට තිබූ මෙම කෘතියේ ප්‍රථම භාගය හා දෙවන භාගය සිංහල භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණද්වාරයෙන් එළිදැක්වීමට ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය (වර්තමාන කැලණිය විශ්වවිද්‍යාලය) කටයුතු කළේ ය. 1964 දී හා 1973 දී පළ වූ මෙම කෘතිද්වය සිංහලයෙන් අධ්‍යාපනය හදාරු විද්‍යාර්ථීන්ගේ ත්, ශාස්ත්‍රීය පඬිවරුන්ගේ ත්, සාමාන්‍ය පාඨකයාගේ ත් නොමඳ ගෞරවයට පාත්‍ර විය.

චිර කලකින් ම මෙම ග්‍රන්ථය විකිණී අවසන් වූ බැවින්, කැලණිය විශ්වවිද්‍යාලයේ 40 වන සංවත්සරය නිමිති කරගෙන 2000 වර්ෂයේදී මෙම ග්‍රන්ථයේ ප්‍රථම භාගය යළි මුද්‍රණය කිරීමට මහාචාර්ය සේනක බණ්ඩාරනායක හා මහාචාර්ය තිලකරත්න කුඩාගමගේ යන උපකුලපතිවරුන්ගේ පුරෝගාමිත්වයෙන් පියවර ගනු ලැබී ය. ඉන් පසු ව මෙම ග්‍රන්ථයේ ප්‍රථම භාගය යළි මුද්‍රණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සිය අවධානය යොමුකොට ඒ සම්බන්ධ මූලික පියවර ගනු ලැබුයේ හිටපු උපකුලපති මහාචාර්ය සරත් අමුණුගම මහතා විසිනි. ඉන් අනතුරුව, වත්මන් උපකුලපති මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර මහතා එම කාර්යය මල්ඵල ගැන්වීම සඳහා අතිශය උනන්දුවකින් යුතු ව කැපවී කටයුතු කළේ ය.

ශ්‍රී ලංකාවේ යටගියාව හා ඉතිහාසය හැදෑරීමට හා අවබෝධ කරගැනීමට විශේෂ උනන්දුවක් ඇති වී තිබෙන වර්තමානයේදී මෙම කෘතිය යළි මුද්‍රණය කිරීමට ඉහත සඳහන් උපකුලපතිතුමන් දෙපළ ගත් උත්සාහය අතිශයින් අගය කරන අතර ම, එම සත් කාර්යය සම්බන්ධයෙන් එතුමන් වෙත අපගේ කෘතඥතාව පළ කරමු.

මහාචාර්ය කේ.එම්.පී. කුලසේකර
ඉතිහාස අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
2015 අප්‍රේල්

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
පීඨාධිපති,
සමාජීය විද්‍යා පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය.

# හැඳින්වීම

ලංකා විශ්වවිද්‍යාලය මගින් ඉංග්‍රීසියෙන් ලියා පළ කරනලද ලංකාඉතිහාසයේ ප්‍රථම කාණ්ඩයේ ප්‍රථමභාගය සිංහලයට පරිවර්තනය කර මෙසේ පළ කරන්නට ලැබීම විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ විශේෂ ප්‍රීතියට හේතු වෙයි. මෙහි ද්විතීයභාගය ද හැකි තාක් ඉක්මනින් පළ කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

ආධුනිකයන්ට ලෙහෙසියෙන් තේරුම් ගත හැකි පරිදි සරල සිංහලව්‍යවහාරය අනුව පරිවර්තනය පිළියෙළ කිරීම අපේ අරමුණ විය. පාරිභාෂික වචන හැර පොත තේරුම් ගැනීමට බාධා වන අන්දමේ යෙදුම් මෙහි සුලබ නොවන බව අපේ හැඟීමයි. ඒ ඒ පරිච්ඡේද සැපයූ ඒ ඒ විද්වතුන්ගේ අදහස් අනුව මුල් ඉංග්‍රීසි පොතේ සමහර තැන් සිංහල පොතේ වෙනස් කරනලද බව ද මෙහිලා සඳහන් කළයුතුය.

ඉමහත් උනන්දුවකින් මෙන්ම සැලකිල්ලකින් ද මේ පරිවර්තනය පිළියෙළ කළ අපේ පර්යේෂණාංශයේ කාර්යමණ්ඩලයට ස්තුති කිරීම මා අයත් යුතුකමකි.

මේ ඉතිහාසය පිළිබඳව ලංකා විශ්වවිද්‍යාලයේ උපකුලපති සර් නිකලස් ආටිගල මහතාණන්ගෙන් ලැබුණු සහයෝගය සහ අනුග්‍රහය අපේ මහත් ධෛර්යයට හේතු වූ බව විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. ස්වභාෂාමාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය දෙනු ලබන මේ කාලයේ ලංකා විශ්වවිද්‍යාලයේ ලංකාඉතිහාසය සිංහලට පරිවර්තනය කර පළ කිරීම අත්‍යවශ්‍ය බව ඒ මහතාණන්ට මැනවින් අවබෝධ වූ නිසාම මේ දුෂ්කර කාර්යය අප වෙත පැවරුණු බව සඳහන් කරනු කැමැත්තෙමු. ඒ මහතාණන්ට අපේ ස්තුතිය පිරිනමන්නේ අතිශය කෘතඥතාවෙනි; මහත්ම හිතවත්කමකිනි.

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාණෝ මේ පරිවර්තනයේ ඉතා වැඩි කොටසක් කියවා බලා මෙය සකස් කිරීම පිළිබඳව මාහැඟි උපදෙස් දුන්හ. මෙහිදී ඇති වූ බොහෝ ප්‍රශ්න විසඳාදීමෙන් ඒ මහතාණන් කළ අනුග්‍රහය නිසා පරිවර්තනයේ වටිනාකම දියුණු වූ බව නිසැකය. ඉංග්‍රීසිපොතේ සංස්කාරකවරයා වූ ඒ මහතාණන්ගේ උපදෙස් සිංහල පරිවර්තනය පිළියෙළ කිරීමෙහිදී ලබාගතහැකි වීම විශිෂ්ට භාග්‍යයක් හැටියට සලකමු. ඒ මහතාණන්ට ද අපේ කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනමමු.

පරිවර්තනයේ කොටස් ගණනක් කියවා බලා සකස් කර දීමෙන් ආචාර්ය ලක්ෂ්මන් සු. පෙරේරා මහතාණන් කළ උපකාරය ද ඉතා උසස් කොට සලකමු. ඒ මහතාණන්ට ද අපේ කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනමමු.

තව ද තමතමන් ලියූ කොටස්වල පරිවර්තනය සකස් කිරීමේදී අපට උදවු දුන් ආචාර්ය නන්දදේව විජේසේකර, මහාචාර්ය කේ. කුලරත්නම්, මහාචාර්ය බී. එල්. ටී. ද සිල්වා යන මහත්වරුන්ට ද අපි කෘතඥ වෙමු.

ඉංග්‍රීසි භාෂාමය පොත සිංහලභාෂාවට පරිවර්තනය කොට පළ කිරීම සඳහා අවශ්‍ය වූ වියදමෙන් වැඩි කොටසක් ආසියා පදනම විසින් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරනලද්දේය. මෙහිදී ආසියා පදනමේ ලංකානියෝජිත මහතුන් දැක්වූ උනන්දුව අපේ විශේෂ ධෛර්යයට හේතුවක් විය. ආසියා පදනමට ද විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ කෘතඥතාපූර්වක ස්තුතිය හිමි වෙයි.

ඒ හැර විශේෂ උද්‍යෝගයකින් යුක්තව පොත මුද්‍රණය කළ විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ අධිකාරී මහතා ඇතුළු කාර්යමණ්ඩලයට ද, චිත්‍රවල ඡායාරූප සපයා දීමෙන් අනුග්‍රහ කළ පුරාවිද්‍යාදෙපාර්තමේන්තුවට ද, අනුරාධපුර යුගය නමැති ග්‍රන්ථයේ එන චිත්‍රවල ඵලකවලින් ප්‍රයෝජන ගැනීමට අවසර දුන් කර්තෘ සංස්කාරක මහතුන්ට ද අපේ කෘතඥතාව ප්‍රකාශ කරමු.

පොත මුද්‍රණය කළ පසු කීපදෙනෙකුට පෙනීගිය වැරදි කීපයක් මෙහි ශුද්ධිපත්‍රයේ සඳහන් කෙළෙමු. එබඳු තවත් වැරදි ඇතොත් දෙවැනි සංස්කරණයේදී සකස් කිරීමට බලාපොරොත්තු වෙමු.

යක්කඩුවේ ප්‍රඥාරාම
පර්යේෂණ මහාචාර්ය

1964 සැප්තැම්බර් 7 වැනිද,
කැලණියේ
විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේදීය.

# සංඥාපනය

සවිස්තර ලංකා ඉතිහාසයක අවශ්‍යතාව වැටහෙන්නට පටන් ගෙන බොහෝ කල් ගත විය. මේ අවශ්‍යතාව ලංකා විශ්වවිද්‍යාලය විසින් පිරිමැසියයුතු යයි 1953 වැන්නේදී සර් අයිවර් ජෙනිංස් මහතා විසින් යෝජනා කරන ලද්දේය. ඒ ඒ උගතුන් විසින් ලියනු ලබන කොටස් ඇතුළත් ඉතිහාසයක් ආචාර්ය ජී. සී. මැන්දිස් මහතාගේ සංස්කාරකත්වයෙන් පළ කිරීම සඳහා වැඩපිළිවෙළක් ද සකස් කරන ලද්දේය. මෙයින් බලාපොරොත්තු වන ලද්දේ සාමාන්‍ය ගණයේ විද්‍යාර්ථීන්ට බොහෝ විට කියවන්නට නොලැබෙන පොත්පත් සඟරාවල විසිර පවත්නා කරුණු සමූහය එකතු කර පිළියෙළ කිරීමය. එහෙත් 1955 වැන්න දක්වාම මේ යෝජනාව ගැන තීරණයක් ඇති වූයේ නැත. මේ වැඩපිළිවෙළ පිරික්සා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාලපාලකසභාවේ අනුකාරකසභාවක් ඒ වර්ෂයේදී පත් කරන ලද්දීය. මේ අනුකාරකසභාව විසින් 1956 වැන්නේ අග භාගයේදී ඉදිරිපත් කරන ලද නිර්දේශවල ප්‍රතිඵලයක් වශයෙන් පුරාණතම අවධිවල පටන් 1947 වැන්න දක්වා කාලයට සම්බන්ධ ලංකා ඉතිහාසග්‍රන්ථයක් සඳහා සැලසුම්පතක් පිළියෙළ කරන ලද්දේය. එකල ඉතිහාසඅංශයේ ප්‍රධානත්වය දැරූ මහාචාර්ය හේම චන්ද්‍ර රාය මහතා විසින් ඒ ඒ අංශ පිළිබඳ පරිච්ඡේද සම්පාදනය කරන ලෙස ඒ ඒ විශේෂඥයන්ට ආරාධනා ද කරන ලද්දීය. 1505 වැන්නේදී පෘතුගීසීන් පැමිණීම දක්වා ලංකා ඉතිහාසය විස්තර කරන I කාණ්ඩයේ ලිපිවලින් කීපයක් හැර අනික් සියලු ලිපි 1957 අග භාගය වන විට ලැබී තිබුණේය. ඒවා මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් සංස්කරණය කරන ලදි.

පිටු අටසියයකින් පමණ යුක්ත වන I කාණ්ඩය පාඨකයන්ගේ පහසුව සඳහා භාග දෙකක් වශයෙන් පළ කළයුතු යයි තීරණය කරන ලදි. එයින් මෙම පළ කරනු ලබන්නේ අනුරාධපුරයුගයේ ඉතිහාසය ඇතුළත් I භාගයයි. දැනට මුද්‍රණය කරනු ලබන II භාගය ද මේ වර්ෂය අවසාන වීමට පෙර පළ කිරීම අපේ බලාපොරොත්තුවයි. මේ වනාහි සවිස්තර ලංකා ඉතිහාසයක් පළ කිරීමට දරන ලද පළමුවැනි වෑයමය. එහෙයින් මෙහි සදොස් තැන් සහ අඩුපාඩු ද ඇති වියහැකිමය. එහෙත් ඉතිහාසය පිළිබඳ විශේෂඥයන්ට සහ ශිෂ්‍යයන්ටත් සාමාන්‍ය උගත් පාඨකයන්ටත් මෙය ප්‍රයෝජනවත් වන බව අපේ හැඟීමයි.

මේ ඉතිහාසය පිළියෙළ කිරීමත් පළ කිරීමත් සඳහා ලංකා විශ්වවිද්‍යාලය විසින් දැරියයුතු වූ වියදමෙන් වැඩි කොටස ආසියා පදනම විසින් පරිත්‍යාග කරන ලද්දේය. මේ නොමසුරු ආධාරය ලබාදීම පිළිබඳව උනන්දුවෙන් ක්‍රියා කළ ආසියා පදනමේ ලංකා නියෝජිතයන් වූ ආර්. ටී. සෙඩ්වික්, විලියම්. ටී. ෆ්ලෙමිං යන මහත්වරුන් දෙදෙනාටත්, මෙහිලා මුලින්ම ඉදිරිපත්ව ක්‍රියා කළ ආචාර්ය ජී. සී. මැන්දිස් මහතාටත්

මා ස්තුති කරන්නේ මහත් ප්‍රීතියෙනි. තව ද සංස්කාරකමණ්ඩලයේ සාමාජික මහතුන්ටත්, ඒ ඒ පරිච්ඡේද සැපයූ භවතුන්ටත්, මේ කාණ්ඩය සම්පාදනය කිරීමේදී උදවු දුන් සෙසු සියලුදෙනාටත් මගේ කෘතඥතාව ප්‍රකාශ කරමි. මෙහි යොදා තිබෙන චිත්‍ර සඳහා ඡායාරූප සපයාදුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාණන්ටත්, සිතියම් පිළියෙළ කිරීමෙහිදී උදවු දුන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පී. යූ. රත්නතුංග මහතාටත් මගේ ස්තුතිය පිරිනමමි. මේ පොත මැනවින් මුද්‍රණය කරවූ ලංකා විශ්වවිද්‍යාලමුද්‍රණාලයේ අධිකාරී එච්. බී. පෙරේරා මහතාට ද මගේ ස්තුතිය හිමි වේ. පරිමිත ප්‍රමාණයක උපකරණ සහ ද්‍රව්‍ය ඉවහල් කරගෙන මේ පොත මුද්‍රණය කිරීමේදී ඇති වූ දුෂ්කරතා රාශිය මග හරවාගැනීමෙන් ඒ මහතා දක්වූ ධෛර්යය සහ ආරම්භක ශක්තිය ද ප්‍රශංසනීයය.

1959, සැප්තැම්බර් 16 වැනිද,
පේරාදෙණියේදීය.

**නිකලස් ආටිගල**

# පටුන


| | පිටු |
|---|---|
| හැඳින්වීම | iii |
| සංඥාපනය | v |
| සිතියම් | xvii |
| චිත්‍ර | xvii |
| සඞ්කේත | xxi |
| ප්‍රස්තාවනාව | xxv |


## I ග්‍රන්ථය

## I පරිච්ඡේදය


| | පිටු |
|---|---|
| **ලංකාඉතිහාසයේ භූවිද්‍යාත්මක සහ භූගෝලීය පසුබිම** | **1 - 19** |
| **අ. භූවිද්‍යාත්මක පසුබිම** | **1 – 9** |
| ජේ. කුලරත්නම් මහතා (එම්. ඒ., පීඑච්. ඩී., ඩී. ශු. පී.) විසිනි. | |
| ලංකාභූතලයේ පරිණාමය | 2 |
| ලංකාවේ පාෂාණසංයුතිය | 3 |
| ලංකාවේ ව්‍යූහය | 5 |
| ලංකාවේ භූවිෂමතාව | 6 |
| භූවිද්‍යාත්මක කරුණු ඉතිහාසය කෙරෙහි බල පාන හැටි | 8 |
| **ආ. භූගෝලීය පසුබිම** | **9 – 19** |
| සී. ඩබ්ලිව්. නිකලස් මහතා විසිනි. | |
| ලංකාවේ භූවිෂමතාවන් හා පිහිටීම | 9 |
| ලංකාවේ ඓතිහාසික භූගෝලවිද්‍යාව | 11 |
| පුරාණ කාලයේ ලංකාව බෙදී තිබුණු ප්‍රදේශ | 12 |
| පුරාණ කාලයේ මංමාවත් | 14 |
| වෙළඳතීර්ථ හා මුහුදුතොටවල් | 16 |

II පරිච්ඡේදය — පිටු

## උද්භිදසංහතිය සහ සත්වසංහතිය — 20 - 27

අ. උද්භිදසංහතිය — 20 - 24

බී. එල්. ටී. ද සිල්වා මහතා (එම්. එස්සී., පීඑච්. ඩී.) විසිනි.

ආ. සත්වසංහතිය — 24 - 27

සී. ඩබ්ලිව්. නිකලස් මහතා විසිනි.

III පරිච්ඡේදය

## මනුෂ්‍යවර්ග සහ භාෂා — 28 - 45

අ. මනුෂ්‍යවර්ග — 28 - 34

නන්දදේව විජේසේකර මහතා (එම්. ඒ., පීඑච්. ඩී.) විසිනි.

ලංකාවේ වෙසෙන විවිධ මනුෂ්‍යජාතීහු — 28
වැද්දෝ — 29
වෙනත් මානවවර්ග — 31

ආ. ලංකාවේ භාෂා — 34 - 45

(අ.) සිංහලභාෂාව — 34 - 41

ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා (එම්. ඒ., පීඑච්. ඩී.) විසිනි.

(ආ) දෙමළභාෂාව — 42 - 45

එස්. නඩේසන් මහතා (බී. ඒ.) විසිනි.

IV පරිච්ඡේදය

## ලංකාඉතිහාසයේ මූලාශ්‍රයයෝ — 46 - 72

ලක්ෂ්මන් සු. පෙරේරා මහතා (බී. ඒ., පීඑච්. ඩී.) විසිනි.

මූලාශ්‍රයයන්ගේ ස්වරූපය — 46
සාහිත්‍යමූලාශ්‍රයයෝ — 47
දීපවංසය, මහාවංසය, චූළවංසය — 47
සිංහලභාෂාමය ඉතිහාසග්‍රන්ථ — 53
ඓතිහාසික කරුණු ඇතුළත් ආගමික ග්‍රන්ථ — 54

පිටු

වංශ ඉතිහාසග්‍රන්ථ 61
ද්‍රවිඩ මූලාශ්‍රයයෝ 61
විදේශීය මූලාශ්‍රයයෝ 62
ශිලාලිපි මූලාශ්‍රයයෝ 66
කාසික මූලාශ්‍රයයෝ 71
පුරාවිද්‍යා මූලාශ්‍රයයෝ 72

V පරිච්ඡේදය

ප්‍රාගෛතිහාසික සමය 73 - 80

නන්දදේව විජේසේකර මහතා විසිනි.

ප්ලයිස්ටෝසීන අවධිය 74
පේලියෝලිතික (පුරාශිලා) අවධිය 75
නියෝලිතික (නවශිලා) හා මයික්‍රෝලිතික (ක්ෂුද්‍රශිලා) අවධි 76
ශිලාසමයවල මිනිසුන්ගේ ජීවනක්‍රමය 77

VI පරිච්ඡේදය

ආර්යජනාවාස: සිංහලයෝ 81 - 94

සෙනරත් පරණවිතාන මහතා (පී. එච්ඩී., සම්මාන ඩී. ලිට්.) විසිනි.

සිංහලයෝ: දක්ෂිණගෝලාර්ධයේ ඉතා ඈත පදිංචි වූ ආර්යයෝ 81
ආර්යයන් ලංකාවේ පදිංචි වීම පිළිබඳ පරම්පරාගත කථා 82
ලංකාවේ පළමුවැනි ආර්ය පදිංචිකරුවන්ගේ මුල් රට: භාෂා පිළිබඳ සාක්ෂි 83
සිංහලයන්ගේ මුල් රට පිළිබඳව බ්‍රාහ්මීශිලාලිපිවලින් හෙළි වන කරුණු 86
සිංහලයන්ගේ සිංහපුරය පිහිටි පෙදෙස; ඔවුන්ගේ සංක්‍රමණ 87
සිංහලයන්ගේ මුල් රට ආර්යාවර්තයේ වයඹපෙදෙසේ පිහිටි බවට සාධක 89
ආදිම සිංහලයන් සහ දකුණුඉන්දියාවැසියන් අතර සබඳතා 92

VII පරිච්ඡේදය

මුටසීව රජු දක්වා ලංකාවේ පැරණි රජවරු 95 - 108

ලක්ෂ්මන් සු. පෙරේරා මහතා විසිනි.

පැරණි රජුන් පිළිබඳ පරම්පරාගත කථාවල තත්වය 95
විජය කුමරු පිළිබඳ පරම්පරාගත කථා 96
පණ්ඩුකාභය රජු පිළිබඳ පරම්පරාගත කථා 102

## II ග්‍රන්ථය

### I පරිච්ඡේදය

පිටු


## ඉන්දියාවේ ආගම්වල වර්ධනය 109 - 121

නලිනාක්ෂ දත්ත මහතා (එම්. ඒ., බී. එල්., පීඑච්. ඩී., ඩී. ලිට්.) විසිනි.

ආර්යයන් පැමිණීමට පෙර ඉන්දියාවේ පැවති ආගම් 109
වෛදික ආගම 111
ජෛනාගම 116
බුද්ධාගම 119


### II පරිච්ඡේදය


## බුද්ධාගම පිහිටුවීම 122 - 140

සෙනරත් පරණවිතාන මහතා විසිනි.

අශෝක රජු හා බුද්ධාගම 122
තුන්වැනි ධර්මසංගායනාව; නොයෙක් රටවලට ධර්මදූතයන් යැවීම 127
මිහිඳු මාහිමියෝ; ලංකාවේ ධර්මදූතව්‍යාපාරය 128
දේවානම්පියතිස්ස රජු සහ අශෝක රජු 130
බුද්ධාගම පැමිණීමට පෙර ලංකාවේ පැවති ආගමික විශ්වාස; දේවානම්පියතිස්ස
රජුට පෙර ලංකාවේ බුද්ධාගම තිබෙන්නට ඇතැයි සිතීමට තුඩු දෙන කරුණු 133
මහාවිහාරයේ ආරම්භය; ස්තූප ගොඩනැගීම 136
ශ්‍රී මහාබෝධිය සහ සංඝමිත්තා මහතෙරණියන් වැඩම කිරීම 137


### III පරිච්ඡේදය


## දුටුගැමුණු රජුගේ ජයග්‍රහණය 141 - 159

සෙනරත් පරණවිතාන මහතා විසිනි.

දේවානම්පියතිස්ස රජුට පසු කාලයේ අනුරාධපුරයේ රජවරු 141
එළාර රජු 142
රෝහණයේ රජවරු 142
කාවන්තිස්ස රජු 145
දුට්ඨගාමිණී කුමාරයා සහ සද්ධාතිස්ස කුමාරයා 148
එළාර රජුට විරුද්ධව දුටුගැමුණු රජු කළ සටන 151
දුටුගැමුණු රජුගේ ආගමික වැඩ 157

## IV පරිච්ඡේදය

පිටු

### සද්ධාතිස්ස රජු පටන් සහ රජු දක්වා කාලය 160 - 173

සෙනරත් පරණවිතාන මහතා විසිනි.


සද්ධාතිස්ස, ලංජතිස්ස, ඛල්ලාටනාග යන රජවරු 160
වට්ටගාමිණී රජු 164
මහාචූළි මහාතිස්ස, කුටකණ්ණ, භාතික අභය, මහාදාඨික මහානාග යන රජවරු 168
ඉළනාග රජු සහ ලම්බකර්ණ වංශිකයෝ 170
පළමුවැනි සිංහලරජපෙළපතේ අවසානය 172


## V පරිච්ඡේදය

### ලම්බකර්ණ රජපෙළපත: වසභ රජු පටන් මහාසේන රජු දක්වා 174 - 188

සෙනරත් පරණවිතාන මහතා විසිනි.


වසභයන් රජකම අත්පත් කරගැනීම; ඔහු කළ වැඩ 174
වසභ රජුගේ පුත්‍රයෝ 176
I ගජබාහු රජු 176
මහල්ලක නාග රජු; ඔහුගේ පුත්‍රයෝ 180
I සිරිනාග රජු සහ කලින් සිටි රජුන් අතර නෑකම; වෝහාරිකතිස්ස රජු 180
සිරිසංඝබෝධි රජු සහ ගෝඨාභය රජු 184
ජෙට්ඨතිස්ස රජු සහ මහාසේන රජු 186


## VI පරිච්ඡේදය

### බුද්ධාගම ඉන්දියාවේ දියුණු වූ අයුරු 189 - 199

ජේ. එන්. බැනර්ජි මහතා (එම්. ඒ., පීඑච්. ඩී.) විසිනි.


විවිධ බෞද්ධ නිකායයන්ගේ විකාශය 189
මහායාන බුද්ධාගමේ වර්ධනය 194
විවිධ බෞද්ධ නිකායයන් ඉන්දියාවේ ඒ ඒ ප්‍රදේශවල පැතිර තිබුණු සැටි 197
ප්‍රමුඛ මහායාන ආචාර්යවරු 198

## VII පරිච්ඡේදය

පිටු

**ද්‍රවිඩදේශයේ සංගම්යුගය** 200 - 209

එස්. නාටේසන් මහතා විසිනි.

සංගම්කාලය 200
තොල්කාප්පියම් ග්‍රන්ථයේ ඓතිහාසික අගය 202
සංගම්සාහිත්‍යයෙන් හෙළි වන දේශපාලනෛතිහාසය 203
සංගම්සාහිත්‍යයේ පිළිබිඹු වී තිබෙන දේශපාලන, අර්ථ, සමාජ තත්වය 206

## VIII පරිච්ඡේදය

**පැරණි යුගයේ සභ්‍යත්වය: අර්ථ, දේශපාලන සහ සමාජ තත්වය** 210 - 233

සෙනරත් පරණවිතාන මහතා විසිනි.

අ. කෘෂිකර්මය 210 – 213
(ආ) ගොවිතැන 211
(ඉ) පැරණි ජනපද පිහිටි ප්‍රදේශ 212
ආ. ජලසම්පාදනය 213 – 217
සී. ඩබ්ලිව්. නිකලස් මහතා විසිනි.
ඉ. වෙළඳාම 217 – 221
(අ) සාමාන්‍ය 217
(ආ) පැරණි මුදල්ක්‍රමය 220
ඊ. දේශපාලනතත්වය 221 – 228
(අ) රජකම: රජතුමා 221
(ආ) යුද්ධනිලධාරීන් සහ පාලකනිලධාරීහු 224
උ. සමාජතත්වය, ව්‍යාපාර සහ වෘත්ති 229 – 231
ඌ. අයබදු සහ ඉඩම්බුක්තිය 232 – 233

## IX පරිච්ඡේදය

**පැරණි යුගයේ සභ්‍යත්වය (ඉතිරි කොටස) ආගම හා කලාශිල්ප** 234 - 258

සෙනරත් පරණවිතාන මහතා විසිනි.

අ. ආගමිකවිකාශය 234 – 247
(අ) බුද්ධාගම රටවැසියන්ගේ ජීවිතය කෙරෙහි බල පෑ අන්දම 234
(ආ) සංඝසමාජක්‍රමය සහ මහාසංඝයාත් රාජ්‍යයත් අතර සම්බන්ධතා 236

පිටු

(ඉ) සංඝයා අතර භේද ඇති වීම 238
(ඊ) බුද්ධාගම සහ ඊට අපර මෙහි පැවති ඇදහිලි 240
(උ) මහායානය පැමිණීම 241
(ඌ) පෞරාණික ධර්මය හා මහායානය අතර ගැටුම 242
(එ) වෙන රටවල් සමඟ පැවති ආගමිකසම්බන්ධතා 247
(ඒ) පැරණි ලංකාවේ ශිවභක්තිකයන්ගේ කෝවිල් 247
ආ. වාස්තුවිද්‍යාව 248 – 255
ඉ. මූර්තිකලාව 255 – 258
ඊ. සාහිත්‍යය 258

## III ග්‍රන්ථය

### I පරිච්ඡේදය

### ඉන්දියානු පසුබිම 259 - 277

අ. ඉන්දියාවේ ගුප්තඅධිරාජ්‍යයේ ආරම්භය සහ ඒ අධිරාජ්‍යයත් ලංකාවත් අතර පැවති සම්බන්ධකම් 259 – 263

ආර්. සී. මජුම්දර් මහතා (එම්. ඒ., පිඑච්. ඩී., එෆ්. ආර්. ඒ. එස්. බී.) විසිනි.

ආ. පල්ලවවංශය සහ පාණ්ඩ්‍යවංශය: එම රාජ්‍යයන් සහ ලංකාව අතර පැවති සම්බන්ධකම් 263 – 272

කේ. ඒ. නීලකණ්ඨ ශාස්ත්‍රී මහතා (එම්. ඒ.) විසිනි.

පල්ලවයන්ගේ ප්‍රභවය සහ ව්‍යාප්තිය 264
පැරණි පල්ලවයෝ 265
සිංහවිෂ්ණු පරම්පරාවේ පල්ලවයන්, සහ පාණ්ඩ්‍යයෝ 266

ඉ. දකුණුඉන්දියාවේ චෝළඅධිරාජ්‍යයේ උන්නතිය 272 – 277

කේ. ඒ. නීලකණ්ඨ ශාස්ත්‍රී මහතා විසිනි.

### II පරිච්ඡේදය

### මහාසේන රජුට පසු කාලයේ රජවරු:
### සිරිමෙඝවණ්ණ රජු පටන් II උපතිස්ස රජු දක්වා 278 - 288

ඩබ්ලිව්. ඒ. ජයවර්ධන මහතා (එම්. ඒ.) විසිනි.

සිරිමෙඝවණ්ණ රජු සමුද්‍රගුප්ත අධිරාජයා සමග පැවැත්වූ මිත්‍රසම්බන්ධතා 278
II ජෙට්ඨතිස්ස රජු සහ බුද්ධදාස රජු 279
උපතිස්ස රජු සහ මහානාම රජු 280

| | පිටු |
|---|---|
| ද්‍රවිඩ රජවරු | 282 |
| ධාතුසේන රජු | 284 |
| I කස්සප රජ | 286 |
| I මොග්ගල්ලාන රජු | 288 |


## III පරිච්ඡේදය

## රජපෙළපත් අස්ථිරව පැවති කාලපරිච්ඡේදය 289 - 303

ලක්ෂ්මන් සු. පෙරේරා මහතා විසිනි.


| | |
|---|---|
| සිලාකාල රජු | 289 |
| II මොග්ගල්ලාන රජු සහ කිත්තිසිරිමේඝ රජු | 293 |
| මහානාග රජු | 293 |
| I අග්ගබෝධි රජු | 294 |
| කැරලි | 295 |
| දඨෝපතිස්ස රජු සහ II කස්සප රජු | 298 |
| IV අග්ගබෝධි රජු | 301 |
| පොත්ථකුට්ඨ | 302 |


## IV පරිච්ඡේදය

## මානවම්ම පෙළපත 304 - 332

ලක්ෂ්මන් සු. පෙරේරා මහතා විසිනි.


| | |
|---|---|
| මානවම්ම රජුගේ මුල් පරපුර; ඔහු පල්ලවයන්ගේ ආධාරයෙන් ලංකාරාජ්‍යය අත්පත් කරගැනීම | 304 |
| මානවම්ම රජුගේ පුත්‍රයෝ | 307 |
| VII අග්ගබෝධි රජු සහ II මහින්ද රජු | 309 |
| I උදය, III මහින්ද ආදී රජවරු | 312 |
| I සේන රජු; පාණ්ඩ්‍යයන් ලංකාව ආක්‍රමණය කිරීම | 315 |
| II සේන රජු; සිංහලයන් පාණ්ඩ්‍ය රට ජයගැනීම | 318 |
| II උදය, IV කස්සප, V කස්සප යන රජවරු* | 319 |
| IV දප්පුල රජු; ඊළඟ රජවරු | 324 |
| IV මහින්ද රජු | 327 |
| IV මහින්ද රජුගේ ඇවෑමෙන් ඇති වූ වියවුල්; අනුරාධපුර රාජ්‍යයේ අවසානය | 330 |

## V පරිච්ඡේදය

පිටු


### චෝළආක්‍රමණ: අනුරාධපුරය වැටීම 333 - 338

කේ. ඒ. නීලකණ්ඨ ශාස්ත්‍රී මහතා විසිනි.

ලංකාවත් පල්ලවයන් සහ පාණ්ඩ්‍යයන් අතර පැවති සම්බන්ධතා 333
V කස්සප රජු පාණ්ඩ්‍යරාජ්‍යයට බලසෙන් යැවීම 333
IV උදය රජුගේ රාජ්‍යකාලයේදී චෝළයන් ලංකාව ආක්‍රමණය කිරීම 334
I රාජරාජ රජු ලංකාවෙන් කොටසක් අල්ලාගැනීම 336
V මහින්ද රජුගේ රාජ්‍යකාලයේ අවුල් වියවුල් 336
I රාජේන්ද්‍ර චෝළ රජුගේ සේනාව ලංකාව අල්ලාගෙන V මහින්ද රජු සිර කර තැබීම 338


## VI පරිච්ඡේදය


### මෑත යුගයේ සභ්‍යත්වය: අර්ථ, දේශපාලන, සමාජ තත්වය 339 - 361

සෙනරත් පරණවිතාන මහතා විසිනි.

අ. ජලසම්පාදනය 339 – 345
සී. ඩබ්ලිව්. නිකලස් මහතා විසිනි.

ආ. කෘෂිකර්මය 346 – 348
ඇ. වෙළඳාම්, කාසි යනාදිය 348 – 350
ඈ. දේශපාලන හා පරිපාලන සංවිධානය 350 – 361

(අ) රජතුමා 350
(ආ) පරිපාලනය සහ වෙනත් රාජකාරි භාරව සිටි නිලධාරීහු 354
(ඇ) අයබදු, ඉඩම්බුක්තිය, සමාජතත්වය යනාදිය 358
(ඈ) ශුභසාධක සේවා 361


## VII පරිච්ඡේදය


### මෑත යුගයේ සභ්‍යත්වය: ආගම, සාහිත්‍යය හා කලාව 362 - 390

සෙනරත් පරණවිතාන මහතා විසිනි.

අ. ආගම 362 – 370

(අ) බුද්ධාගම 362
(ආ) වෙනත් ආගම් [illegible]

| | | පිටු |
|---|---|---|
| ආ. | සාහිත්‍යය | 370 – 378 |
| (අ) | පාලි | 370 |
| (ආ) | සංස්කෘත | 376 |
| (ඉ) | සිංහල | 376 |
| ඉ. | වාස්තුවිද්‍යාව | 378 – 384 |
| ඊ. | මූර්තිකලාව | 384 – 388 |
| උ. | චිත්‍රකලාව | 389 – 390 |
| ඌ. | වෙනත් කලා | 390 |